# මුදල් සහ බැංකු කටයුතු

## මුදල් සැපයුම

1985 වර්ෂයේදී මූල්‍ය අංශයෙහි දක්නට ලැබුන ප්‍රධාන ලක්ෂණය වූයේ මූල්‍ය සමස්තයන්හි වර්ධන වේගය දෙවන වර්ෂය සඳහාත් නොකඩවා අඩු වීමයි. මෙම තත්ත්වය ඇති වූයේ රජයට දෙන ලද ශුද්ධ ණයෙහි තියුණු වැඩිවීම, පෞද්ගලික අංශයට දෙන ලද ණයෙහි මධ්‍යස්ථ වර්ධනය හා බැංකු ක්‍රමයෙහි විදේශීය වත්කම්හි (ශුද්ධ) අඩු වීම මගින් ඇති වූ පසුබිම යටතේය. 1984 දී වූ රුපියල් දශ ලක්ෂ 2,076 ක හෙවත් සියයට 14 ක වර්ධනයක් සමඟ සසඳන විට 1985 දී මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතුවලින් සැදුම් ලත් පටු මුදල් සැපයුම ($M_1$), රුපියල් දශ ලක්ෂ 1,937 කින් හෙවත් සියයට 12 කින් වර්ධනය විය. මේ අතර, වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශය සතු කාලීන හා ඉතුරුම් තැන්පතු (ආසන්න මුදල්) රුපියල් දශ ලක්ෂ 3,044 කින් හෙවත් සියයට 11 කින් වර්ධනය විය. 1984 දී මෙහි වර්ධනය රුපියල් දශ ලක්ෂ 4,095 ක් හෙවත් සියයට 18 ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1985 දී $M_1$ සහ ආසන්න මුදල්වලින් සමන්විත පුළුල් මුදල් සැපයුම ($M_2$), රුපියල් දශ ලක්ෂ 4,982 කින් හෙවත් සියයට 11 කින් වර්ධනය විය. 1984 දී $M_2$ රුපියල් දශ ලක්ෂ 6,171 කින් හෙවත් සියයට 17 කින් විශාල ලෙස වර්ධනය විය.


1985 දී $M_1$ හි ඇති වූ අඩු වර්ධන වේගය මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතු යන දෙඅංශයෙන්ම පිළිබිඹු විය. 1984 දී රුපියල් දශ ලක්ෂ 1,361 කින් හෙවත් සියයට 19 කින් වර්ධනය වූ සංසරණය වෙමින් පවත්නා ව්‍යවහාර මුදල් 1985 දී රුපියල් දශ ලක්ෂ 1,255 කින් හෙවත් සියයට 15 කින් වැඩි විය. අප්‍රේල් මස උත්සව කාලයට පෙර මුදල් සඳහා ඇති වූ කාලීන ඉල්ලුම පිළිබිඹු කරමින් ව්‍යවහාර මුදල් දැරීම්හි ඉහළම මාසික වර්ධනය (සියයට 12) මාර්තු මාසයෙහිදී වාර්තා විය. මහජනයා සතු ඉල්ලුම් තැන්පතු 1985 දී රුපියල් දශ ලක්ෂ 683 කින් හෙවත් සියයට 8 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය විය. 1984 දී මෙම තැන්පතුවල වර්ධනය රුපියල් දශ ලක්ෂ 715 ක් හෙවත් සියයට 9 ක් විය. $M_1$ හි ඉල්ලුම් තැන්පතු කොටස 1984 දී වූ සියයට 49 සිට 1985 දී සියයට 48 දක්වා පහත වැටිණි.

නිරපේක්ෂ වශයෙන් බලන කල ආසන්න මුදල්හි වර්ධනය රුපියල් දශ ලක්ෂ 3,044 ක් වූ නමුත් එහි වර්ධන අනුපාතිකය 1984 දී වූ සියයට 18 සිට 1985 දී සියයට 11 දක්වා පහත වැටිණි. සාපේක්ෂකව වූ මෙම අඩු වර්ධන අනුපාතිකය ප්‍රධාන වශයෙන්ම වාණිජ බැංකු අවස්ථා කීපයකදීම කාලීන හා ඉතුරුම් තැන්පතුවල පොළී අනුපාතිකයන් පහත හෙලීම සහ වර්ෂය තුළදී විදේශ වත්කම් අඩු වීම නිසා ඇති වූ ආදායම් වර්ධනයෙහි පහත වැටීම හේතු කොටගෙන සිදු වූවකි. ආසන්න මුදල්හි වර්ධන වේගයෙහි අඩුවීම විශාල වශයෙන්ම රාජ්‍ය සංස්ථා සතු තැන්පතුවල ඇති වූ රුපියල් දශ ලක්ෂ 301 ක හෙවත් සියයට 6 ක අඩු වර්ධනය නිසා සිදුවූවකි. සංසන්දනාත්මකව බලනකල 1984 දී රාජ්‍ය සංස්ථා සතු තැන්පතුවල වර්ධනය රුපියල් දශ ලක්ෂ 1,428 ක් හෙවත් සියයට 35 ක් විය. ඉහතකී තත්ත්වයට වැඩි වශයෙන්ම හේතු වූයේ තේ මිළ පහත වැටීම නිසා රාජ්‍ය වැවිලි සංස්ථාවන් සතු මෙම තැන්පතු අඩු වීමයි. මේ අතර පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනු කරුවන් සතු තැන්පතුද 1985 දී අඩු විය. මෙසේ ආසන්න මුදල්හි වර්ධන වේගය අඩුවුවද, $M_2$ හි කාලීන හා ඉතුරුම් තැන්පතු කොටස සියයට 61 ලෙස නොවෙනස්ව පැවතුණි.

බැංකු විදේශ වත්කම්හි (ශුද්ධ) අඩු වීමක් පැවති හෙයින් 1985 දී මුදල් සැපයුමෙහි වර්ධනයට බලපාන ලද වැදගත්ම සාධකය වූයේ දේශීය ණයෙහි වූ සැළකිය යුතු වැඩි වීමයි. රජයට දෙන ලද ශුද්ධ ණය ඉහළයාම දේශීය ණය වැඩිවීම කෙරෙහි විශාල වශයෙන් බලපෑවේය. 1984 දී වූ රුපියල් දශ ලක්ෂ 2,979 ක හෙවත් සියයට 17 ක අඩු වීම සමඟ සසඳන විට රජයට දෙන ලද ශුද්ධ ණය 1985 දී රුපියල් දශ ලක්ෂ 6,137 කින් හෙවත් සියයට 42 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු දේශීය ණයෙහි රජයට දෙන ලද ශුද්ධ ණය

# මුදල් සැපයුම

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 43 සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් 1983 – 1985

(ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ)

| | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985 | වෙනස % 1982/1983 | වෙනස % 1983/1984 | වෙනස % 1984/1985 | 1983 | 1984 | 1985 | වෙනස % 1982/1983 | වෙනස % 1983/1984 | වෙනස % 1984/1985 |
| ජනවාරි | 11,852 | 14,964 | 16,522 | + 7·3 | + 26·3 | + 10·4 | 30,802 | 38,277 | 43,923 | + 14·5 | + 24·3 | + 14·8 |
| පෙබරවාරි | 12,234 | 14,939 | 16,595 | + 9·4 | + 22·1 | + 11·1 | 31,708 | 39,031 | 44,849 | + 18·5 | + 23·1 | + 14·9 |
| මාර්තු | 12,986 | 15,439 | 17,237 | + 11·2 | + 18·9 | + 11·7 | 32,874 | 39,762 | 45,230 | + 16·4 | + 21·0 | + 13·8 |
| අප්‍රේල් | 12,842 | 15,317 | 17,332 | + 13·9 | + 19·3 | + 13·2 | 33,114 | 39,629 | 46,019 | + 16·6 | + 19·7 | + 16·1 |
| මැයි | 12,606 | 14,331 | 17,208 | + 13·2 | + 13·7 | + 20·1 | 32,491 | 39,133 | 46,092 | + 11·5 | + 20·4 | + 17·8 |
| ජූනි | 12,589 | 14,768 | 17,339 | + 16·4 | + 17·3 | + 17·4 | 32,798 | 39,690 | 46,233 | + 14·1 | + 21·0 | + 16·5 |
| ජූලි | 12,964 | 14,901 | 16,969 | + 21·1 | + 14·9 | + 13·9 | 33,846 | 39,642 | 46,631 | + 18·9 | + 17·1 | + 17·6 |
| අගෝස්තු | 12,977 | 14,811 | 17,232 | + 19·1 | + 14·1 | + 16·4 | 33,732 | 39,767 | 46,991 | + 18·4 | + 17·9 | + 18·2 |
| සැප්තැම්බර් | 13,322 | 15,549 | 17,460 | + 19·3 | + 16·7 | + 12·3 | 34,620 | 40,808 | 47,917 | + 16·2 | + 17·9 | + 17·4 |
| ඔක්තෝබර් | 13,572 | 16,041 | 17,768 | + 18·9 | + 18·2 | + 10·8 | 35,314 | 41,586 | 48,359 | + 17·1 | + 17·8 | + 16·3 |
| නොවැම්බර් | 13,544 | 15,678 | 18,187 | + 18·3 | + 15·8 | + 16·0 | 35,324 | 42,007 | 47,247 | + 18·3 | + 18·9 | + 12·5 |
| දෙසැම්බර් | 14,748 | 16,824 | 18,761 | + 25·4 | + 14·1 | + 11·5 | 37,257 | 43,427 | 48,409 | + 22·1 | + 16·6 | + 11·4 |
| මාසික සාමාන්‍යය | 13,020 | 15,297 | 17,384 | + 16·1 | + 17·5 | + 13·7 | 33,657 | 40,230 | 46,492 | + 16·9 | + 19·5 | + 15·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ප්‍රමාණය 1984 දී වූ සියයට 29 සිට 1985 දී සියයට 35 දක්වා වැඩි විය. රජයට දෙන ලද ශුද්ධ ණයෙහි වැඩිවීම, රජයට දෙන ලද දළ ණය රුපියල් දශ ලක්ෂ 7,837 කින් (සියයට 43) හා රජයේ තැන්පතු හා මුදල් ශේෂ රුපියල් දශ ලක්ෂ 1,700 කින් (සියයට 47) වැඩි වීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. 1984 දී වූ රුපියල් දශ ලක්ෂ 4,144 ක හෙවත් සියයට 21 ක අඩු වීමට ප්‍රතිවිරුද්ධව, මහ බැංකුවෙන් රජයේ ණය ගැනීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 7,512 කින් හෙවත් සියයට 49 කින් වැඩි විය. මෙයට මූලික වශයෙන් හේතු වූයේ රජයට දෙන ලද තාවකාලික අත්තිකාරම් (රුපියල් දශ ලක්ෂ 174) හා රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් දැරීම්, ප්‍රධාන වශයෙන්ම භාණ්ඩාගාර බිල්පත් දැරීම් (රුපියල් දශ ලක්ෂ 7,337) වැඩි වීමයි. 1984 දී වූ රුපියල් දශ ලක්ෂ 1,336 ක හෙවත් සියයට 85 ක වැඩි වීමක් හා සසඳා බලන කල වාණිජ බැංකු මගින් රජයට දෙන ලද ණය රුපියල් දශ ලක්ෂ 326 කින් හෙවත් සියයට 11 කින් වර්ධනය විය.

රජය විශාල වශයෙන් බැංකු ණය ගැනීමට පෙළඹුන ප්‍රධානම හේතුව වූයේ තේ සඳහා වූ වටිනාකම අනුව අය කරන බද්ද, හා අපනයන බදු අඩුවීම නිසා ඇස්තමේන්තු කරන ලද ප්‍රමාණයට වඩා රජයේ ආදායම සැළකිය යුතු අන්දමින් අඩුවීමයි. අනෙක් අතට, ප්‍රධාන වශයෙන්ම ආරක්ෂක කටයුතු සඳහා වූ වියදම අධික වීම නිසා රජයේ වියදම් වර්ෂය තුළදී නොකඩවා වැඩි වෙමින් පැවතිණි.


1984 දී වූ රුපියල් දශ ලක්ෂ 3,612 ක හෙවත් සියයට 11 ක වැඩි වීම හා සසඳා බලන විට 1985 දී පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය රුපියල් දශ ලක්ෂ 3,163 කින් හෙවත් සියයට 9 කින් වැඩි විය. 1984 මාර්තු සහ මැයි යන මාසවල පනවන ලද ණය සීමාවන් නොකඩවා පවත්වා ගෙන යාම හා උද්ධමන අනුපාතයෙහි වූ අඩුවීම නිසා නාමික වශයෙන් ණය සඳහා වූ ඉල්ලුම අඩු වීම, පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය සඳහා වූ ඉල්ලුම අඩු වීමට හේතු විය. අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන්ට දෙන ලද වාණිජ බැංකු අත්තිකාරම්, ණය (රුපියල් දශ ලක්ෂ 2,090), අයිරා (රුපියල් දශ ලක්ෂ 689) සහ ආනයන බිල්පත් (රුපියල් දශ ලක්ෂ 133) ස්වරූපය ගති. වී අලෙවි මණ්ඩලයෙහි අලෙවි කටයුතුවල අඩුවීම හා සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ 1984/85 මහ කන්නයේ සහ 1985 යල කන්නයේදී දෙන ලද වගා ණය අඩුවීම ප්‍රධාන වශයෙන්ම හේතුකොට ගෙන 1984 දී වූ රුපියල් දශ ලක්ෂ 255 ක හෙවත් සියයට 14 ක අඩුවීම නොනවත්වාම පවත්වාගෙන යමින්, 1985 දී ද සමුපකාර ආයතනවලට දෙන ලද ණය රුපියල් දශ ලක්ෂ 263 කින් හෙවත් සියයට 17 කින් පහත වැටිණි.

1984 දී වූ රුපියල් දශ ලක්ෂ 237 ක හෙවත් සියයට 6 ක අඩු වීම සමග බලන විට 1985 දී රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය රුපියල් දශ ලක්ෂ 290 කින් හෙවත් සියයට 7 කින් වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, රාජ්‍ය වෙළෙඳ නීතිගත සංස්ථාව සහ රාජ්‍ය වැවිලි සංස්ථාවන් (රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය) වාණිජ බැංකුවලින් ගත් ණය ඉහළ යාමයි. වැවිලි සංස්ථාවන්හි තේ ආදායම් අඩුවීම හා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙහි මූල්‍යකරණයන් විදේශ මූලාශ්‍රයන්හි සිට දේශීය මූලාශ්‍රයන්ට මාරුවීම, රාජ්‍ය සංස්ථාවන්හි බැංකු ණය ගැනීම් විශේෂයෙන්ම වර්ෂයේ දෙවන භාගය තුළදී තියුණු ලෙස වැඩි වීමට හේතු විය.

පසුගිය වර්ෂ දෙක තුළදී දක්නට ලැබුන උපනතිය වෙනස් කරමින් 1985 දී විදේශීය අංශය මූල්‍ය සමස්තයන් කෙරෙහි සැළකිය යුතු අන්දමේ සංකෝචනාත්මක බලපෑමක් ඇති කලේය. 1984 දී වූ රුපියල් දශ ලක්ෂ 6,777 ක හෙවත් සියයට 213 ක තියුණු වැඩිවීම හා සසඳන විට 1985 දී බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 691 කින් හෙවත් සියයට 7 කින් අඩු විය. ඉහතින් සඳහන් කළ පරිදි, තේ මිලෙහි පහත වැටීම සහ සංචාරක කටයුතු මගින් වූ ලැබීම්හි අඩුවීම බැංකු විදේශීය වත්කම්හි අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතුවිය.

## දේශීය ණය

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 44 සංඛ්‍යා සටහන

### මූල්‍ය සමස්තයන් සහ ඒවාට තුඩුදුන් සාධක

(ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ)

| ශීර්ෂය | 1983 දෙසැම්බර් | 1984 දෙසැම්බර් | 1985 දෙසැම්බර් | 1983–1984 වෙනස ප්‍රමාණය | 1983–1984 වෙනස ප්‍රතිශතය | 1984–1985 වෙනස ප්‍රමාණය | 1984–1985 වෙනස ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය සමස්තයන්** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 7,200·1 | 8,560·9 | 9,815·5 | + 1,360·8 | + 18·9 | + 1,254·6 | + 14·7 |
| 2. මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු | 7,547·8 | 8,262·9 | 8,945·5 | + 715·2 | + 9·5 | + 682·6 | + 8·3 |
| පටු මුදල් සැපයුම (M1) | 14,747·9 | 16,823·8 | 18,761·0 | + 2,076·0 | + 14·1 | + 1,937·2 | + 11·5 |
| 3. වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු | 22,509·0 | 26,603·5 | 29,647·9 | + 4,094·5 | + 18·2 | + 3,044·4 | + 11·4 |
| 3.1 සමූපකාර ආයතන | 469·2 | 526·8 | 633·5 | + 57·6 | + 12·3 | + 106·7 | + 20·3 |
| 3.2 රාජ්‍ය සංස්ථා | 4,081·1 | 5,508·8 | 5,809·5 | + 1,427·7 | + 35·0 | + 300·7 | + 5·5 |
| 3.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් (අ) | 17,958·7 | 20,567·9 | 23,204·9 | + 2,609·2 | + 14·6 | + 2,637·0 | + 12·8 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 37,256·9 | 43,427·3 | 48,408·9 | + 6,170·5 | + 16·6 | + 4,981·6 | + 11·4 |
| **තුඩුදුන් සාධක** | | | | | | | |
| 1. දේශීය ණය ප්‍රසාරණය (DCE) | 49,293·0 | 49,926·2 | 59,226·1 | + 633·2 | + 1·3 | + 9,299·9 | + 18·6 |
| 1.1 රජයට දෙන ලද ශුද්ධ ණය | 17,533·1 | 14,554·4 | 20,691·4 | - 2,978·7 | - 17·0 | + 6,137·0 | + 42·2 |
| 1.1.1 රජයට දෙන ලද දළ ණය | 20,972·1 | 18,164·6 | 26,001·7 | - 2,807·5 | - 13·4 | + 7,837·1 | + 43·1 |
| මහ බැංකුව විසින් | 19,393·0 | 15,249·1 | 22,760·6 | - 4,143·9 | - 21·4 | + 7,511·5 | + 49·3 |
| වාණිජ බැංකු විසින් | 1,579·1 | 2,915·5 | 3,241·1 | + 1,336·4 | + 84·7 | + 325·6 | + 11·2 |
| 1.1.2 රජයේ තැන්පතු සහ මුදල් ශේෂ | -3,439·0 | -3,610·2 | -5,310·3 | - 171·2 | - 5·0 | - 1,700·1 | - 47·1 |
| 1.2 පෞද්ගලික අංශයට දෙනලද දළ ණය | 31,759·9 | 35,371·8 | 38,534·7 | + 3,611·9 | + 11·4 | + 3,162·9 | + 8·9 |
| 1.2.1 සමූපකාර ආයතන | 1,822·7 | 1,567·6 | 1,304·3 | - 255·1 | - 14·0 | - 263·3 | - 16·8 |
| 1.2.2 රාජ්‍ය සංස්ථා | 4,385·1 | 4,148·2 | 4,437·9 | - 236·9 | - 5·5 | + 289·7 | + 7·0 |
| 1.2.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් | 25,552·1 | 29,656·0 | 32,792·5 | + 4,103·9 | + 16·1 | + 3,136·5 | + 10·6 |
| 2. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) | 3,186·9 | 9,964·1 | 9,272·7 | + 6,777·2 | + 212·7 | - 691·4 | - 6·9 |
| 3. අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) | -15,223·0 | -16,463·0 | -20,089·9 | - 1,239·9 | | - 3,626·9 | |
| 3.1 මහ බැංකුවෙහි අනෙකුත් වගකීම් (ශුද්ධ) | -9,417·4 | -9,982·6 | -13,197·2 | - 565·2 | | - 3,214·5 | |
| 3.2 වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් (ශුද්ධ) | -6,319·3 | -6,506·3 | -7,186·9 | - 186·9 | | - 680·7 | |
| 3.3 හුවමාරු වෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපීම් | 513·7 | 25·9 | 294·2 | - 487·8 | | + 268·3 | |
| පුළුල් මුදල් සැපයුම (M2) | 37,256·9 | 43,427·3 | 48,408·9 | + 6,170·5 | + 16·6 | + 4,981·6 | + 11·4 |


සටහන : සළකුණු වලින් M2 කෙරෙහි ඇතිවූ බලපෑම දක්වේ.

(අ) නිර්නේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

# බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

පසුගිය වර්ෂයේදී මෙන්ම, 1985 දීත් දේශීය මිළ මට්ටම සතුටුදයක අන්දමේ අඩු වර්ධනයක් වාර්තා කල අතර, එමනිසා වර්ෂය මුළුල්ලේම උද්ධමන අනුපාතිකයද පහත් මට්ටමක පැවතිණි. වර්ෂය තුළදී කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය වැඩි වූයේ සියයට 1.5 කින් පමණි. කෘෂිකාර්මික භාණ්ඩවල සැපයුම වර්ධනය වීම හා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරවන ලද ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තීන් ආර්ථිකයෙහි සාමාන්‍ය මිළ මට්ටම පහත වැටීමට මූලික වශයෙන් හේතු විය.

**වාණිජ බැංකු කටයුතු**

විදේශීය වත්කම් මගින් ජනිත කළ ද්‍රවශීලතාවය සැළකිය යුතු අන්දමින් අඩුවී තිබියදීත්, ප්‍රධාන වශයෙන් රජයේ දේශීය වියදම් වැඩි වීම හේතු කොටගෙන 1985 දී වාණිජ බැංකු අධි ද්‍රවශීලතාවයකින් යුක්ත විය. එසේම ණය සීමාකරණයන් නිසා ප්‍රමුඛතා නොලබන අංශවලට ණය සැපයීමට වාණිජ බැංකුවලට නොහැකි වීම සහ පෞද්ගලික අංශයෙන් ණය සඳහා වූ අඩු ඉල්ලුම වාණිජ බැංකුවල අධි ද්‍රවශීලතාවය තවදුරටත් වැඩි වීමට හේතු විය.

1985 දී වාණිජ බැංකුවල අධි ද්‍රවශීලතා තත්ත්වය අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි හා ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි ගණුදෙනු මගින් ප්‍රමක්දුරට පිළිබිඹු විය. කෙටිකාලීන ණය සඳහා වූ ඉල්ලුම අඩුවීම පිළිබිඹු කරමින්, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි නොපියවා පැවති ණය ශේෂයන් වර්ෂය තුළදී සැළකිය යුතු අන්දමින් පහත වැටුණි. ඒ අනුව, මෙම වෙළෙඳපොලෙහි නොපියවා පැවති මාසික ණය දීමේ ශේෂයන් රුපියල් දශ ලක්ෂ 376 සහ රුපියල් දශ ලක්ෂ 103 අතර උච්චාවචනය වෙමින් පැවතිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1984 අවසානයේදී සියයට 14 සිට 15.5 අතර පරතරයක පැවති පොළී අනුපාතිකයන් 1985 අවසානයේදී සියයට 11 සිට 14 අතර පරතරයක් දක්වා පහත වැටුණි. මේ අතර අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමෙහි පහසුම මාර්ගය ලෙස සළකන, ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ වර්ෂය තුළදී සැළකිය යුතු ලෙස ක්‍රියාශීලිවිය. මෙම වෙළෙඳපොළෙහි නොපියවා පැවති ශුද්ධ විකුණුම් ප්‍රමාණය 1984 දී වූ රුපියල් දශ ලක්ෂ 1,563 සිට 1985 ඔක්තෝබර් මාසයේදී රුපියල් දශ ලක්ෂ 3,806 ක ඉහළම් මට්ටමකට පැමිණි අතර, 1985 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 1,529 ක් දක්වා පහත් වැටුණි.

ණය සඳහා වූ ඉල්ලුමෙහි අඩුවීම සහ සීමාකාරී ණය ප්‍රතිපත්තීන් නිසා වාණිජ බැංකුවල ණය තැන්පතු අනුපාතයෙහි සාමාන්‍යය, වර්ෂය තුළදී 0.85 සහ 0.89 අතර උච්චාවචනය විය. මෙම අනුපාත පසුගිය වර්ෂයේදී වූ 0.90 හා 0.96 අතර පරතරය හා සැසඳේ.

1985 දෙවන භාගයේදී වාණිජ බැංකුවල තැන්පතු සහතික පත් සඳහා ඉල්ලුම විශාල ලෙස වැඩි විය. මෙය, ස්ථිර තැන්පතු මගින් ලබන පොළී ආදයම්වලින් සියයට 20 ක් රඳවා ගැනීමේ බදු වශයෙන් අය කරන බවට 1986 අයවැය මගින් කරන ලද ප්‍රකාශයට දක්වූ මූලික ප්‍රතිචාරයක් විය හැකිය. නොපියවා පැවති තැන්පතු සහතික පත් ප්‍රමාණය 1985 අවසන් වන විට රුපියල් දශ ලක්ෂ 168 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 1,068 ක් විය.

1985 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකාවේ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක 25 ක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි මුළු වත්කම්/වගකීම් 1985 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 208 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 20,079 ක් වූවද, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම හේතුකොට ගෙන, එය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් වටිනාකම් අනුව සුළු අඩුවීමක් පෙන්නුම් කෙරිණි. වර්ෂය තුළදී විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි කටයුතු අතර මහ කොළඹ ආර්ථික කොමිසමේ සහ අනෙකුත් අනුමැතිය ලත් නේවාසිකයින්ගේ ව්‍යාපෘති මූල්‍යනය කිරීම ඉතා වැදගත් විය.

පසුගිය වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 6,171 ක වැඩි වීමක් හා සසඳන විට විමර්ශනයට භාජනය වන වර්ෂයේදී වාණිජ බැංකුවල මුළු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,830 කින් වැඩි විය. පසුගිය වර්ෂවලදී පැවති රටාව තවදුරටත් තහවුරු කරමින් 1985 දී සම්පත් වර්ධනයෙන් විශාල කොටසක් (රුපියල් දශ ලක්ෂ 5,361) සමන්විත වූයේ තැන්පතු වගකීම්වලිනි. බැංකුවල අධි ද්‍රවශීලතා තත්ත්වය තරමක් දුරට පිළිබිඹු කරමින් වර්ෂය තුළදී වාණිජ බැංකුවල ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 263 කින් පහත වැටිණි.

රාජ්‍ය බැංකු දෙක ඇතුළු වාණිජ බැංකු කිහිපයක් සිය ගණුදෙනුකරුවන් හට සලසන සේවා තවදුරටත් වැඩි කිරීම සඳහා පරිගණක යන්ත්‍ර භාවිතය පටන්ගත් අතර, සමහර ශාඛාවන්හි ගණුදෙනු කිරීමේ වේලාවත් දීර්ඝ කරන ලදී.

**බැංකු ව්‍යාප්තිය**

ග්‍රාමීය ප්‍රදේශවල තවදුරටත් බැංකු කටයුතු ව්‍යාප්ත කිරීම හා නිෂ්පාදන කටයුතු වර්ධනය කිරීම පරමාර්ථ කොට ගෙන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු නමින් නව ඒකක බැංකු ක්‍රමයක් 1985 දී ආරම්භ කරන ලදී. ඒ අනුව ප්‍රථම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව 1985 ජූලි මස 13 වන දින කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහලදී විවෘත කෙරිණි. අනතුරුව කුරුණෑගල, මාතර හා අනුරාධපුරය යන ප්‍රදේශවලද මෙවැනි බැංකු තුනක් විවෘත කරන ලදී. ඒ සමහම මෙම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ශාඛාවන් 6 ක්, මාතර දිස්ත්‍රික්කයේ ශාඛාවන් 5 ක්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශාඛාවන් 2 ක් හා කළුතර දිස්ත්‍රික්කයේ ශාඛාවන් 3 ක්ද වශයෙන් අදාළ දිස්ත්‍රික්කයන් තුළ වර්ෂය තුළදී ඒවායේ ශාඛාවන් 16 ක් විවෘත කරන ලදී. මහ බැංකුව 1985 දෙසැම්බර් මාසයේදී එහි තුන්වන ප්‍රාදේශීය ශාඛාව මාතලේ නගරයේ විවෘත කරන ලදී.

1985 දී වාණිජ බැංකු ශාඛාවන්හි ව්‍යාප්තිය එතරම් වේගවත් නොවුණි. ප්‍රතිස්ථානගත කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථානයන්ද ඇතුළුව 1985 දී වාණිජ බැංකු ශාඛාවන්හි මුළු ගණන 11 කින් පමණක් වැඩි වූ අතර වර්ෂය අවසානයේදී ශාඛා සංඛ්‍යාව 1,033 ක් විය. ලංකා බැංකුව එහි නව ගොඩනැගිල්ලෙහි ප්‍රධාන ශාඛාව ඇතුළුව 1985 දී ප්‍රධාන ශාඛාවන් 9 ක් විවෘත කළ අතර, ආරක්ෂක හේතූන් මත ශාඛාවන් දෙකක් වසා දමන ලදී. වර්ෂය තුළදී ගොවිජන සේවා මධ්‍යස්ථාන 7 ක් ප්‍රතිස්ථානගත කරන ලද අතර, එසේ කරන ලද්දේ සමහර ශාඛා ප්‍රධාන ශාඛා ලෙස උසස් කිරීමෙන් හා ඇතැම් ශාඛා වෙනත් ප්‍රධාන ශාඛාවන් සමඟ ඒකාබද්ධ කිරීමෙනි. 1985 අගදී ලංකා බැංකුවේ ක්‍රියාත්මක වෙමින් පැවති ප්‍රධාන ශාඛා ගණන 236 ක් විය. මහජන බැංකුව වර්ෂය තුළදී නව ශාඛාවන් 3 ක් විවෘත කළ අතර එක් ශාඛාවක් වසා දැමීය. මේ අතර, එහි එක් ශාඛාවක් ව්‍යාපාර කටයුතු සඳහා නැවත විවෘත කෙරිණි. මේ අනුව මහජන බැංකුවෙහි ප්‍රධාන ශාඛා ගණන 1985 අවසානයේදී 293 ක් බවට පත් විය. ලංකා වාණිජ බැංකුව නව ශාඛාවන් විවෘත නොකළමුත්, එහි එක් ශාඛාවක් නගර කාර්යාල ශාඛාව හා විදේශීය ශාඛාව වශයෙන් කොටස් දෙකකට වෙන් කරන ලදී.


ජාතික ඉතිරි කිරීමේ බැංකුව වර්ෂය තුළදී නව ශාඛාවන් 4 ක් විවෘත කළ අතර ඒ අනුව 1985 වර්ෂය අවසානයේදී එහි මුළු ශාඛා ගණන 56 ක් විය.

**පොලී අනුපාතික**

1985 වර්ෂයේදී පොලී අනුපාතික ව්‍යුහයෙහි දක්නට ලැබුන වෙනස්කම් වූයේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි හා වාණිජ බැංකුවල තැන්පතු අනුපාතිකයන්හි සැළකිය යුතු පහත වැටීම හා තෝරා ගත් ණය අනුපාතිකයන්හි සුළු වශයෙන් කරන ලද අඩුකිරීමයි. ද්‍රවශීලතා තත්ත්වයෙහි වූ සැළකිය යුතු වැඩිවීම හා උද්ධමන අනුපාතිකයෙහි පහත වැටීම නිසා ජාතික ඉතිරි කිරීමේ බැංකුව එහි වාර්ෂික ස්ථාවර තැන්පතු සඳහා වූ තැන්පතු අනුපාතිකය සියයට 18 සිට සියයට

# පොලී අනුපාතික

කාර්තු අවසානයට පැවති සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව.

15 දක්වා අඩුකළ අතර එමගින් අනෙකුත් තැන්පතු අනුපාතිකද අඩු කිරීමට මග සලසන ලදී. මේ අතර මහ බැංකුව විසින් බැංකු පොළී අනුපාතිකය සහ අපනයන ප්‍රතිමූල්‍ය ක්‍රමයන්හි ණය දීමේ අනුපාතිකයන්ද පහත දැමීමෙන් එහි පොළී අනුපාතික ප්‍රතිපත්තිය පිළිබඳව මුදල් වෙළෙඳ පොළට මහ පෙන්වීමක් කළ අතර ඒ මගින් උද්ධමන අනුපාතිකයේ අඩු වීමද සැළකිල්ලට ගෙන වාණිජ බැංකුවල පොළී අනුපාතික මට්ටම පහත හෙලීමට පෙළඹවීමක් කෙරිණි.

මේ අනුව 1985 පෙබරවාරි 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි, මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත සපයන පරිපූරක අපනයන ප්‍රතිමූල්‍ය ණය සඳහා අය කරන පොළී අනුපාතිකය සහ එම ණය සඳහා වාණිජ බැංකු විසින් ගණුදෙනුකරුවන්ගෙන් අය කරන පොළී අනුපාතිකයද අඩු කරන ලදී. ඒ අනුව මෙම ණය සඳහා බලපැවැත්වෙන ණය දෙන අනුපාතිකය සියයට එකකින් පහත වැටිණි.

ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි තැන්පතු අනුපාතිකයන් අඩුකිරීම, අධි ද්‍රවශීලතා තත්ත්වය සහ උද්ධමන අනුපාතිකය පහත වැටීම, 1985 ප්‍රථම භාගයේදී වාණිජ බැංකු තැන්පතු අනුපාතිකයන් ප්‍රතිශත අංක 1 සිට 3 දක්වා ප්‍රමාණයකින් අඩු කිරීමට ප්‍රධාන වශයෙන් හේතුවිය. ජාතික ඉතිරි කිරීමේ බැංකුව 1985 පෙබරවාරි මාසයේදී එහි වාර්ෂික ස්ථාවර තැන්පතු සඳහා වූ පොළිය සියයට 18 සිට සියයට 15 දක්වාද, මාස 6 ක ස්ථාවර තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 14 සිට 13 දක්වාද අඩු කළේය. මේ අනුව, වාණිජ බැංකුවල වාර්ෂික ස්ථාවර තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකයද සියයට 12 සිට 18 ක පරතරයක් දක්වා පහත වැටිණි. එසේම මහ බැංකුවේ පොලී ප්‍රමාණ ප්‍රතිපත්තියට සහ උද්ගත වූ වෙළෙඳපොල තත්වයන්ට ප්‍රතිචාරයක් වශයෙන්, 1985 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි ලංකා බැංකුව සහ මහජන බැංකුව ඔවුන්ගේ ණය දෙන අනුපාතිකයන් ප්‍රතිශත අංක 1 කින් අඩුකරන ලදී. අනෙකුත් වාණිජ බැංකුවල වාර්ෂික ස්ථාවර තැන්පතු අනුපාතිකයන්ද මාර්තු මාසයේදී වූ වර්ෂයකට සියයට 14 සිට 22 අතර පරතරයක සිට 1985 වර්ෂය අවසන් වනවිට වර්ෂයකට සියයට 12 සිට 18 අතර පරතරයක් දක්වා පහත වැටිණි.

වර්ෂයේ ද්විතීය භාගයේ දී, අධි ද්‍රවශීලතාවය අඩු කිරීම හා වාණිජ බැංකුවලට ඔවුන්ගේ තැන්පතු හා ණය අනුපාතිකයන් පහත දැමීම සඳහා පෙළඹවීම පිණිස, මහ බැංකුව වෙත වාණිජ බැංකුවල තැන්පතු වගකීම් සඳහා තැබිය යුතු ව්‍යවස්ථාපිත සංචිත අනුපාත වැඩි කෙරිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වාණිජ බැංකුවල අරමුදල් පිරිවැය වැඩි වූ අතර, එමගින් ප්‍රථමයෙන් තැන්පතු අනුපාතිකද ඉන්පසුව ණය දෙන අනුපාතිකද අඩු කිරීමට පෙළඹුණි. ඒ අනුව සියළුම වාණිජ බැංකුවල තැන්පතු අනුපාතිකයන් තවදුරටත් සියයට 1 කින් අඩුකරන ලදී. 1985 සැප්තැම්බර් මාසයේදී ප්‍රධාන වශයෙන්ම ප්‍රමුඛතා අංශවලට දෙන ණය සඳහා අයකරන පොළී අනුපාතිකයන් ප්‍රතිශත අංක 1 සිට 3 දක්වා ප්‍රමාණයකින් අඩුකරන බව රාජ්‍ය බැංකු මගින් ප්‍රකාශයට පත්කරන ලද අතර, එය 1985 ඔක්තෝබර් මස 1 දින සිට ක්‍රියාත්මක විය. අනෙකුත් වාණිජ බැංකුවල ණය දීමේ අනුපාතිකයන්ද සියයට 12 සිට 33 අතර පරතරයක සිට 1985 අවසාන වනවිට සියයට 11 සිට 30 අතර පරතරයක් දක්වා ක්‍රමයෙන් අඩුවිය.

1985 ඔක්තෝබර් මාසයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව තවදුරටත් සිය තැන්පතු පොළී අනුපාතිකයන් සියයට 16 සිට 15 දක්වා අඩු කල අතර, මෙය අනුගමනය කරමින් වාණිජ බැංකු විසින්ද තම තැන්පතු සහතිකපත්වල පොළී අනුපාතික වර්ෂයකට සියයට 13 සිට 22.2 අතර පරතරයක සිට වර්ෂයකට සියයට 8 සිට 20.5 අතර පරතරයක් දක්වා පහත දමන ලදී.

වර්ෂය තුළදී මූල්‍ය සමාගම්ද ඔවුන්ගේ තැන්පතු අනුපාතිකයන් අඩු කරන ලදී. උදාහරණයක් වශයෙන්, මෙම සමාගම්වල වාර්ෂික ස්ථාවර තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකයන් 1984 දෙසැම්බර් මස වූ වර්ෂයකට සියයට 21 සිට 24 අතර පරතරයක සිට 1985 අවසන් වනවිට වර්ෂයකට සියයට 18 සිට 22 අතර පරතරයක් දක්වා පහත වැටිණි.

වාණිජ බැංකුවල හා අනෙකුත් මූල්‍ය ආයතනවල අධි ද්‍රවශීලතාවය පිළිබිඹු කරන අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පොළී අනුපාතිකයන්ද 1984 අවසානයේ වූ වර්ෂයකට සියයට 14 සිට 15.50 අතර පරතරයක සිට 1985 අවසන් වනවිට වර්ෂයකට සියයට 11 සිට 14 අතර පරතරයක් දක්වා පහත වැටිණි.

දිගුකාලීන ණය දෙන ආයතන අතුරින්, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවෙහි හා ජාතික සංවර්ධන බැංකුවෙහි ණය දෙන අනුපාතිකයන් නොවෙනස්ව පැවතිණි. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවෙහි ණය දෙන අනුපාතිකයන් වර්ෂයකට සියයට 11 සිට 14 දක්වා පරතරයක පැවති අතර, ජාතික සංවර්ධන බැංකුවෙහි ණය දෙන අනුපාතිකයන් වර්ෂයකට සියයට 7 සිට 14 අතර පරතරයක පැවතිණි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අවම ණය දෙන අනුපාතිකය වර්ෂයකට සියයට 12 සිට වර්ෂයකට සියයට 10 දක්වා පහත දැමීම නිසා එහි ණය දෙන අනුපාතික වර්ෂයකට සියයට 10 සිට 24 අතර පරතරයක පැවතිණි.

මේ අතර, ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි ගණුදෙනුද වර්ෂය තුළදී ප්‍රසාරණය විය. මහ බැංකුවෙහි සාමාන්‍ය ශුද්ධ විකුණුම් ප්‍රමාණය 1984 දී රුපියල් දශ ලක්ෂ 1,013 සිට රුපියල් දශ ලක්ෂ 2,518 දක්වා වැඩි විය. කෙසේ වුවද, ද්‍රවශීලතාවය සඳහා වූ කාලීන ඉල්ලුම හේතුකොටගෙන 1985 අවසානයේදී මහ බැංකුවෙහි ශුද්ධ විකුණුම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,529 ක් දක්වා පහත වැටිණි.

1985 දෙවන භාගය තුළදී භාණ්ඩාගාර බිල්පත්වල (ප්‍රාථමික සහ ද්විතියික) පොළී අනුපාතිකයන්ද අවස්ථා කිහිපයකදීම පහත වැටිණි. එමෙන්ම 1985 අවසාන වනවිට මහ බැංකුව, බැංකු පොළී අනුපාතිකය සහ ප්‍රතිමූල්‍ය ණය අනුපාතිකයන් බොහොමයක් ප්‍රතිශත අංක 2 කින් අඩු කරනු ලැබීය. (මෙම වෙනස් කිරීම පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රතිපත්ති අංශයෙහි විස්තර සහිතව සාකච්ඡා කර ඇත).

මහ බැංකු කටයුතු

1984 දී වූ රුපියල් දශ ලක්ෂ 175 (සියයට 0.5) ක සුළු වැඩි වීමක් සමග සසඳන විට 1985 අවසන් වනවිට රුපියල් දශ ලක්ෂ 7,887 (සියයට 24) ක සැළකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරමින් මහ බැංකුවෙහි මුළු වත්කම්/වගකීම් රුපියල් දශ ලක්ෂ 41,159 ක් බවට පත් විය.

වත්කම් අංශයෙහි ප්‍රධාන වශයෙන්ම, විදේශ මුදල් හා ශේෂ දූරීම් රුපියල් දශ ලක්ෂ 1,515 කින් අඩු වීම හේතුකොටගෙන 1984 දී රුපියල් දශ ලක්ෂ 5,317 කින් වැඩි වූ මහ බැංකුවෙහි ජාත්‍යන්තර සංචිතය (දළ) 1985 දී රුපියල් දශ ලක්ෂ 1,134 කින් (සියයට 9 කින්) අඩු විය. මේ අතර විදේශ සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශ ලක්ෂ 384 කින් වැඩි විය.

1984 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 4,777 ක අඩුවීමට වෙනස්ව, 1985 වර්ෂයේදී මහ බැංකුව සතු දේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 7,336 කින් සැලකිය යුතු ලෙස වැඩිවිය. මෙයට ප්‍රධානම හේතුව වූයේ රුපියල් දශ ලක්ෂ 7,337 කින් භාණ්ඩාගාර බිල්පත් දූරීම වැඩි වීමයි. මහ බැංකුව මගින් වාණිජ බැංකුවලට හා අනෙකුත් මූල්‍ය ආයතනවලට සපයන ලද අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 175 කින් අඩු වූ අතර මෙය කෙටිකාලීන ණය රුපියල් දශ ලක්ෂ 218 කින් අඩු වීමේ හා මැදි හා දිගුකාලීන ණය රුපියල් දශ ලක්ෂ 43 කින් සුළු වශයෙන් වැඩි වීමේත් ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. ප්‍රතිමූල්‍ය ක්‍රමයන් යටතේ සපයන ලද කෙටිකාලීන අත්තිකාරම් අඩුවීම, විශාල වශයෙන්ම අපනයන ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ සපයන අරමුදල් සඳහා වූ ඉල්ලුම අඩු වීම නිසා සිදු වූවකි. මෙම වර්ෂය තුළදී, මහ බැංකුවෙහි අනෙකුත් වත්කම් හා ගිණුම්ද රුපියල් දශ ලක්ෂ 1,685 කින් වර්ධනය විය. මෙය ප්‍රධාන වශයෙන්ම ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් ඉදිරි විකුණුම් (රුපියල් දශ ලක්ෂ 505), ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් ඉදිරි මිළදී ගැනීම් (රුපියල් දශ ලක්ෂ 316) හා මහ බැංකුව විසින් කළ ඇපවීම් (රුපියල් දශ ලක්ෂ 239) වැඩි වීම නිසා සිදුවූවකි.

වගකීම් අංශයෙහි, සංසරණයෙහි පවත්නා මුදල් හා තැන්පතු වලින් සමන්විත මූල්‍ය වගකීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 3595 (සියයට 17) කින් වර්ධනය විය. රජය, වාණිජ බැංකු හා අනෙකුත් අංශ සතු තැන්පතු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 776 කින්, රුපියල් දශ ලක්ෂ 1,465 කින් සහ රුපියල් දශ ලක්ෂ 601 කින් වර්ධනය වූ අතර, ජාත්‍යන්තර සංවිධාන, විදේශ රාජ්‍යයන් හා විදේශ බැංකු ආයතන සතු එම තැන්පතු රුපියල් දශ ලක්ෂ 967 කින් අඩු විය. වාණිජ බැංකු සතු තැන්පතු සැළකිය යුතු ලෙස වර්ධනය වීමට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ 1984 සිට බලපවත්වන ලද ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන්හි වැඩි කිරීමයි. මහ බැංකුව විසින් රජයේ ණය ගැනීම් වලින් කොටසක් තැන්පතු ස්වරූපයෙන් එහිම රඳවා ගැනීම, රජයේ තැන්පතු වැඩිවීමට ප්‍රධාන හේතුව විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ගිණුමෙහි තැන්පතු අඩු වීම මගින් මූලිකවම විදේශ සංවිධානයන්හි තැන්පතු අඩු වීම පිළිබිඹු විය.

වර්ෂය තුළදී මහ බැංකු සුරැකුම්පත් නිකුතු 8 ක් වාර්තා වූ අතර ඒ අනුව නොපියවා පැවති මහ බැංකු සුරැකුම්පත් ප්‍රමාණය 1984 දී වූ රුපියල් දශ ලක්ෂ 557 සිට 1985 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 1,168 ක් දක්වා වැඩි විය. මේ අතර, ජාත්‍යන්තර සංචිත ප්‍රති ඇගයීම් ගිණුමෙහි වූ රුපියල් දශ ලක්ෂ 1,374 ක වැඩි වීම හේතුකොටගෙන මහ බැංකුවෙහි අනෙකුත් වගකීම් සහ ගිණුම් රුපියල් දශ ලක්ෂ 3,687 කින් වැඩි විය. ලාභාලාභ ගිණුම, ආසියානු නිෂ්කාශණ සංගමයෙහි ගිණුම් ශේෂයන් සහ පාලක ගිණුම් සංචිතයෙහි වූ වැඩි වීම්ද අනෙකුත් වගකීම් හා ගිණුම් වැඩි වීමට හේතුවිය.

**මූල්‍ය ප්‍රතිපත්තිය**

මුදල් සැපයුම කෙරෙහි බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) විසින් ඇති කරන ලද සංකෝචනාත්මක බලපෑම, බැංකු ක්‍රමය වෙතින් රජයේ ණය ගැනීම තියුණු ලෙස වැඩි වීම මගින් අවැසි පමණටත් වඩා සමහන් විය. 1985 දී ආර්ථිකයේ දක්නට ලැබුණ අධි ද්‍රවශීලතා තත්ත්වය පාලනය කිරීම සඳහා මහ බැංකුව 1984 දී හඳුන්වා දුන් සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්තීන් නොකඩවා පවත්වාගෙන යන ලදී. ඉල්ලුම් කළමනාකරණය වෙත යොමු වූ සමස්ත මූල්‍ය ප්‍රතිපත්තිය තුළින්, ස්ථායිතාවය හා වර්ධනය යන ද්විත්ව පරමාර්ථයන් අතර සමතුලිතතාවයක් පවත්වාගෙන යාම සඳහා තෝරා ගත් පරිපූරක ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කෙරුණි. මූර්ත පොළී අනුපාතිකයන් සැළකිය යුතු අන්දමින් ඉහළ නංවමින් ඇති වූ මිල මට්ටමෙහි පහත වැටීම නිසා, 1985 දෙවන භාගයේ දී විශේෂයෙන්ම වාණිජ බැංකු අත්තිකාරම් සඳහා වූ පොළී අනුපාතික මට්ටම් අඩුකිරීම කෙරෙහි මූලිකව ක්‍රියා කරන ලදී.

1985 දී මහ බැංකුවෙහි ණය ප්‍රතිපත්තිය ප්‍රමුඛතා අංශවලට ණය සැපයීම වැඩි කිරීම කෙරෙහි සහ ප්‍රමුඛතා නොවන අංශ වෙත ණය සැපයීම සීමා කිරීම කෙරෙහි යොමු විය. ඒ අනුව, අත්‍යාවශ්‍ය නොවන ආනයන සඳහා වාණිජ බැංකු මගින් සපයන ණය සීමා කිරීමට පනවන ලද සීමාවන්, මූල්‍ය සමාගම්හි ණය සැපයීම මත පනවන ලද සීමාවන් මගින් තවදුරටත් ශක්තිමත් කෙරුණි. 1985 ජනවාරි 21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම සඳහා මූල්‍ය සමාගම් විසින් සපයන ණය සහ අත්තිකාරම් ප්‍රමාණය 1985 ජනවාරි මස 18 වන දිනට දෙන ලද එදිනට නොපියවා පැවති එම ණය ප්‍රමාණය නොඉක්මවිය යුතු විය. තවද, මූල්‍ය සමාගම්වල ණය දීමේ ධාරිතාවය, ඉහළ ද්‍රවශීලතා අනුපාතයක් පැනවීම මගින් තවදුරටත් සීමා කරන ලදී. 1985 ජූනි 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි සෑම දිනකම ලැබෙන හා එදිනට පවතින තැන්පතු වලින් සියයට 15 ක් ද්‍රවශීල වත්කම් වශයෙන් තබා ගන්නා ලෙස මූල්‍ය සමාගම් වලින් ඉල්ලා සිටිනු ලැබීය.

සම්ප්‍රදායික නොවන අපනයන අංශය සඳහා තවදුරටත් යානුබලයන් සැපයීම අරමුණු කොටගෙන, සම්ප්‍රදායික නොවන අපනයන සඳහා වන පරිපූරක ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ සපයන ණය සඳහා, මහ බැංකුව වාණිජ බැංකු වලින් අය කරන පොළී අනුපාතිකය සහ එකී

ණය සඳහා වාණිජ බැංකු විසින් ගණුදෙනු කරුවන්ගෙන් අය කළයුතු පොළී අනුපාතිකය තවදුරටත් අඩු කරන ලදී. 1985 පෙබරවාරි 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුව විසින් වාණිජ බැංකු වලින් අය කරන එම ප්‍රතිමූල්‍ය ණය පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 8.75 සිට වර්ෂයකට සියයට 7.8 දක්වා අඩුකරන ලද අතර එම ණය සඳහා වාණිජ බැංකු විසින් ගණුදෙනු කරුවන්ගෙන් අය කළයුතු පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 12.75 සිට වර්ෂයකට සියයට 11.8 දක්වා අඩු කෙරුණි. මේ අතර, පෞද්ගලික අංශයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා දිගුකාලීන ප්‍රාග්ධන පහසුකම් සැපයීමේදී සහාය වීම සඳහා, වාණිජ බැංකුවල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වගකීම් වෙනුවෙන්, මහ බැංකුවේ තැබිය යුතු සංචිත වලින් කොටසක් නැතහොත් එම සංචිත වලින් අවෙන් පංගුව නොඉක්මවන ප්‍රමාණයක්, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ බැඳුම්කර වශයෙන් තබා ගැනීමට, 1985 ජූනි මාසයේදී මහ බැංකුව මගින් වාණිජ බැංකුවලට අනුමැතිය දෙන ලදී. මේ මගින් ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ද්‍රවශීලතා පදනම ශක්තිමත් වූ අතර, ඒ සමගම වාණිජ බැංකුවලට එම බැඳුම්කර මගින් පොළී ආදායමක් ලැබීමටද අවස්ථාව සැලසුණි. 1985 අවසානයේදී වාණිජ බැංකු රුපියල් දශ ලක්ෂ 333 ක ප්‍රමාණයක් ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ බැඳුම්කරවල ආයෝජනය කර තිබිණි.

1984 මැද භාගයේදී වෙළෙඳ බැංකුවල තැන්පතු අනුපාතිකයන්හි අඩු වීමක් තිබියදීත්, 1985 සැප්තැම්බර් මාසය වනතෙක් වාණිජ බැංකුවල ණයදීමේ අනුපාතිකයන්හි සැළකිය යුතු අඩු වීමක් දක්නට නොලැබුණි. අධි ද්‍රවශීලතාවය අඩු කිරීමේ අරමුණෙන් 1985 අගෝස්තු හා සැප්තැම්බර් යන මාසවලදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන් තවදුරටත් වැඩි කෙරුණි. ඉතිරි කිරීම් හා ඉල්ලුම් තැන්පතු සඳහා වූ සංචිත අනුපාතයන් පිළිවෙලින් සියයට 8 සිට 10 දක්වාද, 16 සිට 18 දක්වාද වැඩිකරන ලදී. වාණිජ බැංකුවල ඉතාමත්ම කෙටිකාලීන තැන්පතු දැරීම වළක්වාලීමේ අරමුණෙන්, දින 90 නොඉක්මවන කාලීන තැන්පතු සඳහා වූ සංචිත අනුපාතය සියයට 8 සිට සියයට 14 දක්වා අවස්ථා දෙකකදී (අගෝස්තු සහ සැප්තැම්බර්) ඉහළ නැංවූ අතර, දින 90 ඉක්මවන එම තැන්පතු සඳහා වූ සංචිත අනුපාතය සියයට 8 සිට සියයට 10 දක්වා ඉහළ නැංවිණි.

අධි ද්‍රවශීලතාවය, මුදල් වෙළෙඳපොලේ පොළී අනුපාතිකයන් පහත වැටීම හා උද්ධමන අනුපාතිකයෙහි අඩු වර්ධනය සැළකිල්ලට ගත් මහ බැංකුව 1985 අගෝස්තු මාසයේදී, කල් පිරීමේ කාලසීමාව අවුරුදු 6 ලෙස එසේම තිබියදී, රජයේ සුරැකුම්පත් සඳහා වන පොළී අනුපාතිකය සියයට 16 සිට සියයට 14 දක්වා අඩුකරන ලෙස රජයට උපදෙස් දෙනලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකයන්ද (ප්‍රාථමික හා ද්විතීයික) 1985 සැප්තැම්බර් මාසයේ සිට අවස්ථා කීපයකදීම අඩු කරන ලදී. ඒ අනුව, 1985 දී ප්‍රාථමික බිල්පත් සඳහා පොළී අනුපාතිකය, වර්ෂයකට සියයට 14 සිට වර්ෂයකට සියයට 11.5 දක්වා පහත දමන ලද අතර ද්විතීයික භාණ්ඩාගාර බිල්පත්හි මිළදී ගැනීමේ හා විකිණීමේ අනුපාතිකයද පිළිවෙලින් වර්ෂයකට සියයට 14.2 සහ වර්ෂයකට සියයට 14.0 සිට වර්ෂයකට සියයට 11.5 සහ වර්ෂයකට සියයට 11.3 දක්වා පහත දමන ලදී.

මේ අතර, ප්‍රමුඛතා අංශවලට දෙන ණය සඳහා වන පොළී අනුපාතිකය තවදුරටත් පහත හෙළීමේ අරමුණෙන් මහ බැංකුව 1985 දෙසැම්බර් 30 වෙනි දින බැංකු පොළී අනුපාතිකය (සියයට 13 සිට සියයට 11) සහ වගා සහ අලෙවි පහසුකම් සඳහා වන ප්‍රතිමූල්‍ය පහසුකම් හැරුණුවිට, වාණිජ බැංකුවලට හා අනෙකුත් මූල්‍ය ආයතනවලට ලබා ගත හැකි අනෙකුත් සියළුම ප්‍රතිමූල්‍ය ණය සඳහා වන ණය දීමේ අනුපාතිකයන් ප්‍රතිශත අංක 2 කින් පහත දැමීය. මෙම පොළී අනුපාතිකයන් පහත දැමීම මගින්, වාණිජ බැංකු ස්වකීය ණය දීමේ අනුපාතිකයන් අඩු කිරීමට පෙළඹෙනු ඇතැයි අපේක්ෂා කෙරිණ. (මෙම වෙනස්කම්වල සම්පූර්ණ විස්තර මෙම වාර්තාවේ දෙවන කොටසෙහි දැක්වේ).

පෞද්ගලික අංශය වෙත සපයන වාණිජ බැංකු ණය හා අත්තිකාරම් සඳහා පනවන ලද ණය සීමාකරණයන් සහිත පසුබිමක් යටතේ සකස් කරන ලද 1985 ජාතික ණය සැලසුම මගින් උත්සාහ ගන්නා ලද්දේ ප්‍රමුඛතා අංශවලට (ප්‍රධාන වශයෙන්ම අපනයන හා කෘෂිකාර්මික කටයුතු) දෙන ලද ණය හා අත්තිකාරම්, එම ණය සීමාකරණයන්ගෙන් ඉවත් කොට තිබීම හේතුවෙන්, එකී ප්‍රමුඛතා අංශවලට වැඩි ණය ප්‍රමාණයක් යොමු කිරීමටය. 1985 සඳහා මූල්‍ය සමීක්ෂණය සකස් කිරීමෙන් අනතුරුව, වර්ෂය අවසන් වනවිට සියළුම වාණිජ බැංකු වලින් පෞද්ගලික අංශයට සපයනු ලබන ණයෙහි නොපියවා පවත්වා ගත හැකි ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 38,807 ක් විය යුතු යයි ඉලක්ක කරන ලදී. මෙය 1984 දී ඉලක්ක කරනලද රුපියල් දශ ලක්ෂ 5,129 ක හෙවත් සියයට 16 ක වැඩි වීම හා සසඳා බලනවිට රුපියල් දශ ලක්ෂ 3,435ක හෙවත් සියයට 10 ක වැඩි වීමකි. මේ අතර ණය මුදල් ආංශික වශයෙන් වෙන් කිරීමේදී කෘෂිකාර්මික, අපනයන හා කර්මාන්ත යන අංශයන් තවදුරටත් ආර්ථිකයේ ප්‍රමුඛතා අංශ වශයෙන් සැළකිණි.

1984 දී හඳුන්වා දෙන ලද ණය සීමාවන් නොකඩවා පවත්වාගෙන යාම හා 1985 වර්ෂය තුළදී හඳුන්වා දෙන ලද සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්ති හේතුකොට, ගෙන මුලදී බලාපොරොත්තු වූ කාර්තුමය ඉලක්කයන් සමඟ සසඳනවිට වර්ෂයේ කාර්තු සතර පුරාම වාණිජ බැංකු ණය සැපයීමෙහි අඩු වීමක් දක්නට ලැබිණි. රුපියල් දශ ලක්ෂ 38,807 ක මූලික ඉලක්කයක් සමඟ සසඳන විට, රුපියල් දශ ලක්ෂ 584 ක හෙවත් සියයට 2 ක හිඟයක් පෙන්නුම් කරමින්, 1985 අවසානයේදී පෞද්ගලික අංශයට සපයන ලද මුළු ණයෙහි නොපියවා පැවති ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 38,223 ක් විය. මෙම හිඟය වඩාත් කැපී පෙනුනේ සැප්තැම්බර් මස අවසානයේදී දෙන ලද ණය ප්‍රමාණය මුලින් ඉලක්ක කොට ගත් ප්‍රමාණයටත් වඩා රුපියල් දශ ලක්ෂ 1,162 කින් අඩු වූ අවස්ථාවේදීය. කෙසේ වුවද, ණය සඳහා වූ කාලීන ඉල්ලුම ඉහළ යාමත් සමඟ, 1985 අවසානය වනවිට මෙම පරතරය අඩු විය. අපනයන සහ කෘෂිකාර්මික කටයුතු සඳහා සපයන ණය, ණය සීමාවන්ගෙන් ඉවත් කොට තිබුණද, මෙම අරමුණු සඳහා දෙන ලද ණයෙහි නොපියවූ ප්‍රමාණය, වර්ෂය මුළුල්ලේම ඉලක්ක කොට ගත් ප්‍රමාණයන්ට වඩා අඩුවෙන් පැවතිණි. අපනයන සඳහා දෙන ලද ණය භාවිතා කිරීම අඩු වීමට ප්‍රධාන හේතුව වූයේ විශේෂයෙන්ම තේ සඳහා වූ අපනයන මිල පහත වැටීමයි. කෘෂිකාර්මික කටයුතු සඳහා දෙන ලද ණය භාවිතා කිරීම අඩු වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, වී මිළදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය සිදුකළ සීමිත ක්‍රියාකාරිත්වය හා සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ 1984/85 මහ කන්නයේ සහ 1985 යල කන්නයේ සපයන ලද ණය හා අත්තිකාරම් අඩු වීමයි.

ණය සීමාකරණයන් නොකඩවා පවත්වාගෙන යාම, මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම හා ණය ගැනීමේදී වූ ඉහළ පිරිවැය හේතුකොටගෙන, 1985 දී පෞද්ගලික අංශයට දෙන ලද ණයෙහි වාර්ෂික වර්ධනය සියයට 9 කට සීමා විය. මෙය පෞද්ගලික අංශයට සපයන ලද ණයෙහි 1984 වර්ෂයේදී වූ සියයට 11 ක වාර්ෂික වර්ධනය සමඟ සැසඳේ. කෙසේ වුවද, රජයේ ණය ගැනීම 1984 දී වූ සියයට 17 ක ඍණ වර්ධනයක සිට 1985 දී සියයට 42 ක ධන වර්ධනයක් දක්වා තියුණු ලෙස වැඩි වීම නිසා, 1985 අවසන් වන විට දේශීය ණය සියයට 1 සිට සියයට 19 දක්වා වර්ධනය විය.

1985 දී මිළ පිළිබඳව දක්නට ලැබුන ප්‍රධාන ලක්ෂණය වූයේ පාරිභෝගික මිළයන්හි වූ අඩු වර්ධනයයි. ලක්ෂ්‍යමය පදනමක් මත ගණනය කරන ලද කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය, 1984 දී වූ සියයට 9.5 සිට 1985 දී සියයට 1.5 ක් දක්වා අඩු වූ අතර එම මිළ දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය වර්ධනය 1984 දී වූ සියයට 17 සිට 1985 දී සියයට 1.5 දක්වා පහත වැටිණි. ප්‍රධාන වශයෙන්ම ආහාර ද්‍රව්‍යයන්හි සැපයුම වැඩි වීම හේතුකොටගෙන, සැපයුම් අංශයෙහි ඇති වූ වර්ධනය සමඟ මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරවන ලද සීමාකාරී මූල්‍ය හා ණය ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම, මිළ සම්බන්ධයෙන් මෙවැනි සතුටුදායක වර්ධනයක් ඇති වීමට විශාල වශයෙන් හේතු විය.